දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) NA /04/පොදු 01/2018
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2019.05.3
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medici

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
ශික්ෂණ රෝහල් /මහ රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත.

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන) තනතුරේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු-2018

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන)තනතුරේ සිටින නිලධාරීන්ගේ ස්ථාන මාරු ලබා දීමට අදාලව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ අංක 01-34/2018 හා 2018.07.23 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන්ගේ ස්ථාන මාරු සඳහා මේ සමඟ දක්වා ඇති ඇමුණුම 01 ලේඛනයේ "රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ තීරණය" යන තීරුවේ දැක්වෙන නිර්දේශ අනුව කටයුතු කරන ලෙසට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම්ගේ අංක **HSC/TRA/NUR/14/05/2018** හා **2019**.03.29 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

03. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන)තනතුරට උසස් වී අදාල තනතුරේ වැඩ භාරගත් දිනයට අනුව සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව ස්ථාන මාරු නිර්දේශය ලබා දී ඇත. එහිදී එකම දින විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන)තනතුරට උසස් වී එකම දින සේවයට වාර්තා කළ නිලධාරීන්ගේ I ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන )තනතුරට උසස් වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨතාවය තීරණය කර ඇති අතර I ශ්‍රේණියේ හෙද නිලධාරී (අධ්‍යාපන )තනතුරට උසස් වූ දිනය ද සමාන වන්නේ නම් ඔවුන් පශ්චාද් ප්‍රාථමික හෙද විදුහලේ හදාරන ලද ඉගැන්වීම හා අධීක්ෂණය පාඨමාලාවේ අවසාන පරීක්ෂණයේදී ලබා ගත් කුසලතාවය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කර ඇති බව සලකන්න.

04. අදාල නිලධාරීන් මුදා හැරීමට අවශ්‍ය අනුප්‍රාප්තිකයින් 2018.01.30 දින සිට විශේෂ ශ්‍රේණියට උසස් වී 2019.05.17 දින වැඩ භාරගන්නා නිලධාරීන්ගෙන් හා ස්ථාන මාරු මත ඔබ රෝහල යටතේ පාලනය වන හෙද විදුහලට පැමිණෙන නිලධාරීන්ගෙන් ලබා දීමට නියමිත අතර ඒ අනුව අදාල ස්ථාන මාරු නියෝග ලබා තිබෙන නිලධාරීන් නව සේවා ස්ථාන වෙත මුදා හැරීමට කටයුතු කරන මෙන් දන්වමි.

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

ඒ.එම්.කේ.කේ අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය